කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2021

අප්‍රේල් - 2024

**BMGT E3015 - උපායශීලී කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි .

ප්‍රශ්න හයයි **පහකට** (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 01

උපායශීලී කළමනාකරණ ක්‍රියාවලියේ අවසාන ප්‍රතිඵලය වන්නේ සංවිධානයේ උපායශීලී අරමුණු ලඟා කිරීමයි.

(අ) සංවිධානයේ උපායශීලී අරමුණු යනු මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ආ) උපායශීලී කළමනාකරණ ක්‍රියාවලියේ අඩංගු පියවරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ඉ) ඉහත (ආ) හි අඩංගු පියවරයන් එකිනෙකට සම්බන්ධවන ආකාරය පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර පැහැදිලි කිරීමට යෝග්‍ය නිදසුන් උපකාරී කරගන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 02

බාහිර පාරිසරික බලවේගයන් නිරන්තරයෙන් වෙනස් වෙයි. ඒවා ආයතනවල ක්‍රියාකාරකම්වලට බලපෑමක් ඇතිකරයි.

(අ) වර්ථමාන ආයතනික උපායශීලී කටයුතු අධ්‍යනය කිරීමට බාහිර පාරිසරික බලවේගයන් වැදගත් වන්නේ ඇයි ද ? පැහැදිලි කරන්න.

(ලකුණු 03)

(ආ) පසුගිය වසර පහ තුළ, ආහාර තොග කර්මාන්තයට බලපෑම් එල්ල කළ ප්‍රධාන පරිසර සාධක දෙකක් පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 07)

(ඇ) උපායශීලී කළමනාකරණය ක්‍රියාවලියේ පදනම ලෙස යොදා ගන්නේ කෙසේද යන්න දක්වමින්, පරිසර විශ්ලේෂණය කිරීමට යොදාගන්නා මාර්ගෝපදේශයක් ලෙස SWOT විශ්ලේෂණය පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

(අ) පොදු උපායන් යනු කුමක්ද? මෙම උපායන් ආයතනයේ මූලික (grand) උපායන්ගෙන් වෙනස්වන්නේ කෙසේද? විස්තර කරන්න.

(ලකුණු 10)

(ආ) පහත ව්‍යාපාරික උපායන් යුගලයන්හි වෙනස්කම් පිළිබඳව, සැබෑ නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

i. තිරස් සංයෝජන උපායන් සහ සිරස් සංයෝජන උපායන්

(ලකුණු 05)

ii. සම්බන්ධිත නොවන විවිධාංගීකරණ උපායන් සහ සම්බන්ධිත විවිධාංගීකරණ උපායන්

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

වර්ධන කොටස් න්‍යාසයක් (Growth Share Metrix (BCG)) යනු ව්‍යාපාරික උපකරණයකි. මෙය වෙළෙඳපළ ආශ්‍රිත කොටස සහ කර්මාන්තයේ වර්ධන අනුපාතය ගණනය කිරීමට යොදාගන්නා අතර ඒ තුළින් අනාගත ව්‍යාපාරික ආයෝජන කළඹයන් ඇගයීමටත්, ඉදිරි ආයෝජන උපායන් යෝජනා කිරීමත් සිදුකරයි.

(අ) වර්ධන කොටස් න්‍යාසය (BCG METRIX) ආකෘතිය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) මෙම BCG න්‍යාසයේ ඉහළ වෙළෙඳපළ කොටස තුළ හා ඉහළ කර්මාන්ත වර්ධන අනුපාතය තුළ ව්‍යාපාර ඒකකය ස්ථානගත වී ඇත්නම්, ඔබ විසින් යෝජනා කරනු ලබන උපායමාර්ග පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

උපායන් ක්‍රියාත්මක කිරීමේදී සිදුවන්නේ වැඩසටහන්, අයවැය සහ ක්‍රියාපටිපාටීන් සංවර්ධනය කිරීමයි.

අ) බොහෝ ආයතනවල උපායන් ක්‍රියාත්මක කිරීමේ පියවර අසාර්ථක වන්නේ ඇයි? හේතු දක්වන්න.

(ලකුණු 05)

ආ) ආයතනවල පරිනිත අවධිය තුළ උපායන් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය සිදු කරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) උපායන් ගොඩනැංවීම සහ ක්‍රියාත්මක කිරීම යනු එකිනෙකට වෙනස් ක්‍රියාවන් 02 කි. ඔබ මෙම ප්‍රකාශනය සමඟ එකඟවන්නේද? පැහැදිලි කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

උපායන් ඇගයීම උපායශීලී කළමනාකරණයේ වැදගත් කාර්යයකි.

අ) උපායන් ඇගයීම සහ පාලන ක්‍රියාවලියේ පියවර මොනවාද?

(ලකුණු 05)

ආ) උපායන් ඇගයීම දුෂ්කර කාර්යයකි. මෙයට හේතු මොනවාද?

(ලකුණු 05)

ඇ) උපායශීලී කළමනාකරණ ක්‍රියාවලියේ පාලන ක්‍රියාවලිය යනු කුමක්ද? විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**